රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.05.01**

**නිවේදන අංකය: 412/2021**
**නිකුත් කළ වේලාව:21:30**

**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)**
**ප්‍රවෘත්ති කර්තෘ**

**<u>අද කොවිඩ් මරණ 09 යි</u>**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 09 ක් අද (01) තහවුරු කරන ලද අතර ඒ අනුව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 687 කි.

01. කරඳන ප්‍රදේශයේ පදිංචි 65 හැවිරිදි පුරුෂයෙකි. හොරණ මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 අප්‍රේල් මස 29 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19 පපුවේ ආසාදනය සහ නිදන්ගත අක්මා රෝගී තත්වයයි.

02. අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචි 72 හැවිරිදි පුරුෂයෙකි. කෝපායි කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් යාපනය ශික්ෂණ රෝහල වෙත මාරුකර යවා ඇති අතර එම රෝහලේදී 2021 අප්‍රේල් මස 30 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙනුයේ COVID 19 සමඟ සංකීර්ණ වූ උග්‍ර කිරීටක සින්ඩ්‍රෝමය සහ හෘදයාබාධ තත්වයයි.

03. රුවන්වැල්ල ප්‍රදේශයේ පදිංචි 75 හැවිරිදි පුරුෂයෙකි. පළමුව වතුපිටිවල මූලික රෝහලට ඇතුලත් වී පසුව ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් 19 අසාදිතයකු බව හඳුනාගැනීමෙන් පසුව හෝමාගම මූලික රෝහල වෙත ඇතුලත් කර ඇත. 2021 අප්‍රේල් මස 28 වන දින කොවිඩ් නියුමෝනියාව තත්වය හේතුවෙන් මියගොස් ඇත.

04. දේවාලගම ප්‍රදේශයේ පදිංචි 66 හැවිරිදි කාන්තාවකි. හෝමාගම මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 අප්‍රේල් මස 30 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ COVID 19 ආසාදනය හේතුවෙන් ඇතිවූ ශ්වසන අපහසුතා තත්වයයි.

05. මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි 79 හැවිරිදි පුරුෂයෙකි. වරකාපොල මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් 19 අසාදිතයකු ලෙස හඳුනාගැනීමෙන් පසුව තෙල්දෙණිය මූලික රෝහල වෙත මාරුකර යවා ඇති අතර එම රෝහලේදී 2021 අප්‍රේල් මස 30 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර නිදන්ගත පුප්ඵුසීය අවහිරතා රෝගයේ පසුබිම සහිත උග්‍ර COVID නියුමෝනියාව,දියවැඩියාව සහ අධි රුධිර පීඩන තත්වයයි.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவனியு, கொழும்பு 05, இலங்கை.
දු.ක / தொ.பே / T (+94 11) 2515759
ෆැ / பெ / F (+94 11) 2514753
www.news.lk

06. යක්විල ප්‍රදේශයේ පදිංචි 33 හැවිරිදි පුරුෂයෙකි. අඹන්පොල ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් තෙල්දෙණිය මූලික රෝහල වෙත මාරුකර යවා ඇති අතර එම රෝහලේදී 2021 අප්‍රේල් මස 30 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ දරුණු COVID නියුමෝනියාව සහ අලුතෙන් හඳුනාගත් දියවැඩියා රෝගයේ පසුබිම තුළ උග්‍ර වකුගඩු ආබාධිත තත්වයයි.

07. වලපනේ ප්‍රදේශයේ පදිංචි 57 හැවිරිදි පුරුෂයෙකි. රිකිල්ලගස්කඩ මූලික රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් 19 අසාදිතයකු ලෙස හඳුනාගැනීමෙන් පසුව ජාතික බෝවන රෝග විද්‍යායතනය වෙත මාරුකර යවා ඇත. 2021 අප්‍රේල් මස 30 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර ශ්වසන අපහසුතා සින්ඩ්‍රෝමය සමග COVID නියුමෝනියාව සහ ලේ විෂවීමේ තත්වයයි.

08. රත්නපුර ප්‍රදේශයේ පදිංචි 68 හැවිරිදි පුරුෂයෙකි. රත්නපුර ශික්ෂණ රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් 19 අසාදිතයකු ලෙස හඳුනාගැනීමෙන් පසුව ජාතික බෝවන රෝග විද්‍යායාතනය වෙත මාරුකර යවා ඇති අතර එම රෝහලේදී 2021 මැයි මස 01 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ ලේ විෂවීමේ කම්පනය සමග ලේ කැටිගැසීම, COVID නියුමෝනියාව, උග්‍ර වකුගඩු හානිවීම, දියවැඩියා රෝගය සහ අධි රුධිර පීඩන තත්වයයි.

09. කුලියාපිටිය ප්‍රදේශයේ පදිංචි 69 හැවිරිදි පුරුෂයෙකි. කුලියාපිටිය ශික්ෂණ රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටින අතර කොවිඩ් අසාදිතයකු ලෙස හඳුනාගැනීමෙන් පසුව අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත මාරුකර යවා ඇත. 2021 අප්‍රේල් මස 30 වන දින මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව, වකුගඩු හානිවීම සහ නිදන්ගත වකුගඩු රෝගී තත්වයයි.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**